" විශිෂ්ඨ රාජ්‍ය සේවාවක් සඳහා ඇප කැපවෙමු "

**ප්‍රධාන ලේකම් කාර්යාලය - බස්නාහිර පළාත**
**பிரதான செயலாளர் அலுவலகம் - மேல் மாகாணம்**
**OFFICE OF THE CHIEF SECRETARY - WESTERN PROVINCE**

204, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
204, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்ல.
204, Denzil Kobbekaduwa Mawatha, Battaramulla.

ප්‍රධාන ලේකම් / பிரதான செயலாளர் / Chief Secretary
දුරකථන / தொலைபேசி / Telephone - 011 - 2092599
ෆැක්ස් / பெக்ஸ் / Fax - 011 - 2092601
ඊ-මේල් / மின்னஞ்சல் / E-mail - chiefsecretary@wpc.gov.lk
පොදු දුරකථන / பொது தொலைபேசி இலக்கம் / General Telephone - 011 - 2093000

SLSI ISO 9001 · SLAB ACCREDITED ISO/IEC: 17021 QMS-001-01

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No. | CSWP/FIN-AP/03/FI/06(B) | ඔබේ අංකය / உமது இலக்கம் / Your No. | | දිනය / திகதி / Date | 2024.08.05 |

## මූල්‍ය චක්‍රලේඛ 10/2024

ආණ්ඩුකාර ලේකම් (බ.ප.),
අමාත්‍යාංශ ලේකම්වරු (බ.ප.),
සභා ලේකම් (බ.ප.),
පළාත් කොමිෂන් සභාවල ලේකම්වරු (බ.ප.),
නියෝජ්‍ය ප්‍රධාන ලේකම්වරු (බ.ප.),
දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් (බ.ප.),
ව්‍යවස්ථාපිත අධිකාරිවල සභාපතිවරු (බ.ප.),
බස්නාහිර පළාතේ සියලුම ප්‍රාදේශීය ලේකම්වරු.

**ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ හා සේවා එක් මිල කැඳවීමක් මත රාජ්‍ය ආයතන විසින් මිලදී ගැනීමට අවස්ථාව සලසාදීම**

"ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ(විවිධ) නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ හා සේවා එක් මිල කැඳවීමක් මත රාජ්‍ය ආයතන විසින් මිලදී ගැනීමට අවස්ථාව සලසා දීම" සම්බන්ධයෙන් වන 2024.06.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයෙහි පිටපතක් මේ සමග අමුණා ඇත.

02. ආණ්ඩුකාර ලේකම්ගේ අංක : GOS/ADM/6/2/19-1 හා 2024.07.24 දිනැති ලිපිය මගින් ඉහත සඳහන් අමාත්‍ය මණ්ඩල තීරණය අවශ්‍ය හදිසි අවස්ථා වලදී පමණක් භාවිතා කිරීම පිණිස බස්නාහිර පළාත් සභාවට අදාල කර ගැනීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලැබී ඇති බව දැනුම් දී ඇත. එහෙයින් මෙම අමාත්‍ය මණ්ඩල තීරණයෙහි සඳහන් විධි විධාන ප්‍රකාරව කටයුතු කරන මෙන් කාරුණිකව දන්වමි.

එස්.එල්. ධම්මිකා කේ. විජයසිංහ,
ප්‍රධාන ලේකම්, පළාත් මුදල්
අමාත්‍යාංශ ලේකම් හා පළාත්
භාණ්ඩාගාර ලේකම් වෙනුවට
බස්නාහිර පළාත.

දුරකතන : 0112-093416
ෆැක්ස් : 0112-092636
විද්‍යුත් ලිපිනය : accpay@cs.wpc.gov.lk

පිටපත: 01.විගණකාධිපති
02.අධ්‍යක්ෂ (අභ්‍යන්තර විගණන)
03.තොරතුරු තාක්ෂණ නිලධාරී.


| නියෝජ්‍ය ප්‍රධාන ලේකම් / பிரதி பிரதம செயலாளர் / Deputy Chief Secretary | පාලන / நிர்வாகம் / Administration | පිරිස් හා පුහුණු / ஆளணி மற்றும் பயிற்சி / Personnel & Training | මුදල / நிதி / Finance | සැලසුම් / திட்டமிடல் / Planning | ඉංජිනේරු / பொறியியல் / Engineering | ප්‍රධාන අභ්‍යන්තර විගණක / பிரதம உள்ளக கணக்காய்வாளர் / Chief Internal Auditor |
|---|---|---|---|---|---|---|
| | Tel : 0112092606<br>Fax : 0112092609<br>dcsadmin@cs.wpc.gov.lk | Tel : 0112092631<br>Fax : 0112092647<br>dcspt@cs.wpc.gov.lk | Tel : 0112092640<br>Fax : 0112092636<br>dcsfinance@cs.wpc.gov.lk | Tel : 0112092532<br>Fax : 0112092533<br>dsplan@cs.wpc.gov.lk | Tel : 0112092501<br>Fax : 0112092505<br>dcs@eng.wpc.gov.lk | Tel : 0112092628<br>Fax : 0112092625<br>cia@cs.wpc.gov.lk |

රහසිගතයි

ඇමුණුම (I)

අමාත්‍ය මණ්ඩල කාර්යාලය
அமைச்சரவை அலுவலகம்
OFFICE OF THE CABINET OF MINISTERS

CABINET DECISION    අමාත්‍ය මණ්ඩල තීරණය    அமைச்சரவைத் தீர்மானம்

මගේ අංකය: අමප/24/0989/604/106    2024 ජුනි මස 04 දින.

පිටපත්:

ජනාධිපති ලේකම්.
අග්‍රාමාත්‍ය ලේකම්.
අනෙකුත් සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්.
විගණකාධිපති.

ක්‍රියා කළ යුතු:

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්.
සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව.

**ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ හා සේවා එක් මිල කැඳවීමක් මත රාජ්‍ය ආයතන විසින් <u>මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම</u>**

(මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ගරු ඇමතිතුමා ඉදිරිපත් කළ 2024-05-17 දිනැති සංදේශය)

2024 මැයි මස 27 දින පැවැත්වුණු අමාත්‍ය මණ්ඩල රැස්වීමේදී එළඹි තීරණයක් අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.එම්.ඩී.ජේ.ප්‍රනාන්දු
අමාත්‍ය මණ්ඩලයේ ලේකම්.

30. අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 24/0989/604/106 වූ, "ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ හා සේවා එක් මිල කැඳවීමක් මත රාජ්‍ය ආයතන විසින් මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම" යන මැයෙන් මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති ඇමතිතුමා ඉදිරිපත් කළ 2024-05-17 දිනැති සංදේශය - (අමප අංක 23/1305/604/133 පිළිබඳව වූ 2023-07-31 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අදාළව) ඉහත සඳහන් සංදේශය අමාත්‍ය මණ්ඩලය විසින්

→ 2

සලකා බලන ලදී. මේ පිළිබඳව සාකච්ඡා කිරීමෙන් අනතුරුව, වර්ෂයක කාලයක් සඳහා පමණක් වලංගු වන පරිදි සංදේශයේ 3 ඡේදයේ (3.1) සහ (3.2)හි යෝජිත අයුරින් කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබා දීමට තීරණය කරන ලදී.

තවද, මෙම තීරණය සම්මත කරනු ලැබූ සේ සැලකීමටත්, ඒ අනුව අවශ්‍ය කටයුතු සඳහා අදාළ බලධාරීන් වෙත මෙම තීරණය දන්වා යැවීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්ට බලය පැවරීමටත් තීරණය කරන ලදී.

ක්‍රියා කළ යුතු: මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
සභාපති, ශ්‍රී ලංකා රාජ්‍ය වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

පිටපත්: ජනාධිපති ලේකම් - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
අග්‍රාමාත්‍ය ලේකම් - සංදේශයේ පිටපතක් යා කොට ඇත.
අනෙකුත් සියලුම අමාත්‍යාංශ - සංදේශයේ පිටපතක් යා කොට ඇත.

30. Cabinet Paper No.24/0989/604/106, a Memorandum dated 2024-05-17 by the Minister of Finance, Economic Stabilization and National Policies on "**Providing the opportunity for Public Sector Institutions to purchase goods and services from Sri Lanka State Trading (General) Corporation on a single quotation**" - (Cabinet decision dated 2023-07-31 on CP No.23/1305/604/133 refers) the above Memorandum was considered by the Cabinet. After discussion, it was decided to grant approval to pursue action as proposed in (3.1) and (3.2) in paragraph 3 of the Memorandum, to be valid only for a period of one (01) year.

It was also decided to treat this decision as confirmed and to authorize the Secretary to the Cabinet of Ministers to convey the same to the relevant authorities for necessary action accordingly.

Action by: **My/Finance, Economic Stabilization and National Policies**
**Chairman, Sri Lanka State Trading (General) Corporation** - copy of Memorandum annexed.

Copied to: **Secretary to the President** - copy of Memorandum annexed.
**Secretary to the Prime Minister** - copy of Memorandum annexed.
**All Other Ministries** - copy of Memorandum annexed.

Checked by : 1.......
2.......

24/0989/604/106

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01 இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka.

කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011 2484700
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823
වෙබ් අඩවිය / இணையத்தளம் / Website: www.treasury.gov.lk

30

මගේ අංකය / எனது இல / My No: MF/041/CM/2024/116
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.05. 17

# අමාත්‍ය මණ්ඩල සංදේශය

## ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් භාණ්ඩ හා සේවා එක් මිල කැඳවීමක් මත රාජ්‍ය ආයතන විසින් මිල දී ගැනීමට අවස්ථාව සලසා දීම

1. පසුබිම

1.1. ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව (STC) 1970 අංක 33 දරන පනතින් ස්ථාපිත කර ඇති අතර 1992 වර්ෂයේ සිට රාජ්‍ය සමාගමක් වශයෙන් රාජ්‍ය ආයතන සඳහා විවෘත වෙළඳපොළේ මිලට සාපේක්ෂව තරඟකාරී මිල ගණන් මත කාර්යාල උපකරණ, ලිපි ද්‍රව්‍ය, පරිගණක හා එහි උපාංග, ටයර් හා බැටරි, කෘෂි කාර්මික යන්ත්‍ර උපකරණ, ලී භාණ්ඩ, ගෘහ විදුලි උපකරණ, විද්‍යුත් විදුලි උපකරණ, සූර්යපැනල හා සෞඛ්‍ය ආරක්ෂිත නිෂ්පාදන යනාදී භාණ්ඩ හා සේවා සපයනු ලබයි.

1.2. එවකට අභ්‍යන්තර වෙළඳ, ආහාර සුරක්ෂිතතාවය හා පාරිභෝගික සුභසාධන අමාත්‍යතුමා විසින් අංක අමප/20/0887/218/011 හා 2020.05.27 දිනැතිව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2020.06.10 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී එළඹි තීරණයට අනුව තනි මූලාශ්‍ර මිල කැඳවීමේ ක්‍රමයක් මත සියළුම රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ, උපකරණ හා සේවා රුපියල් මිලියන 50ක සීමාවකට යටත්ව ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිල දී ගැනීමට මාස 12ක කාල සීමාවක් සඳහා අනුමැතිය ලබාදී ඇත. ඉන්පසු අඛණ්ඩව වසරක් පාසා එම අනුමැතිය දීර්ඝ කර ඇති අතර මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා විසින්ද අංක අමප/23/1305/604/133 හා 2023.07.14 දිනැතිව ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2023.07.31 දින පැවති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව තනි මූලාශ්‍ර කැඳවීමේ ක්‍රමයක් මත සියළු රාජ්‍ය ආයතන සඳහා අවශ්‍ය භාණ්ඩ උපකරණ හා සේවා රුපියල් මිලියන 20ක උපරිම සීමාව දක්වා දැනට පවතින ආකාරයටම භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කර ගැනීමට මාස 12ක කාල සීමාවක් සඳහා දෙනු ලබන අනුමැතිය 2024 ජූලි මස 30වන දින අවසන් වේ.

## 2. විස්තරය හා සාධාරණීකරණය

2.1. රාජ්‍ය ආයතන සඳහා හදිසි මිල දී ගැනීම් අත්‍යවශ්‍ය වන අවස්ථාවල දී හා රාජ්‍ය ආයතනවල එදිනෙදා කටයුතු පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය භාණ්ඩ ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් මිලදී ගැනීමේ හැකියාව පවතී. ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවෙන් තනි මිල කැඳවීමකින් භාණ්ඩ ලබාගැනීම හේතුවෙන් රාජ්‍ය අංශයේ ආයතනවල අවශ්‍යතාවයන් කඩිනමින් හා පහසුවෙන් සපුරා ගැනීමට හැකි වී ඇත. විශේෂයෙන් රාජ්‍ය අංශයට හා පෞද්ගලික අංශය සඳහා අවශ්‍ය කාර්යාල ලිපි ද්‍රව්‍ය, පරිගණක හා ඒ හා සම්බන්ධ උපාංග, ගෘහ විදුලි උපකරණ හා උපාංග, ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ උපකරණ, කෘෂි කාර්මික යන්ත්‍ර උපකරණ, වාහනවලට අවශ්‍ය ටයර් හා බැටරි, ලී භාණ්ඩ, විද්‍යුත් විදුලි උපකරණ, සූර්ය පැනල හා ඉක්මනින් අලෙවි වන පාරිභෝගික භාණ්ඩ (Fast Moving Consumer Goods) වෙළඳපලේ පවතින මිලගණන් වලට වඩා අඩු මිල ගණන් යටතේ ලබා ගැනීමට අවස්ථාව ඇත.

2.2. මහා භාණ්ඩාගාරයට වැය බරක් නොමැතිව ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ව්‍යාපාර කටයුතු, සේවකයින් 300ක පමණ කාර්ය මණ්ඩලයක් සහිතව ස්වයං මූල්‍ය සම්පාදන ආයතනයක් වශයෙන් පවත්වා ගැනීමට හැකි වී ඇත. එමෙන්ම 2022/2023 ගිණුම් වර්ෂයෙහි ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාවේ ශුද්ධ ලාභය රුපියල් මිලියන 533ක් දක්වා ඉහළ ගොස් ඇති අතර පසුගිය වසරේ ශුද්ධ ලාභය වූ මිලියන 430ක මුදල හා සැසඳීමේදී 23%ක වර්ධනයකි. එමෙන්ම 2023 වර්ෂයේදී ලාභාංශ ලෙස රුපියල් මිලියන 190 ක ප්‍රමාණයක් ප්‍රකාශයට පත්කර ඇති අතර එයින් රුපියල් මිලියන 150ක ප්‍රමාණයක් මහා භාණ්ඩාගාරය වෙත ලබාදීමට සමත්ව ඇත.

2.3. රාජ්‍ය ආයතන තුළ පවත්නා නීති හා රෙගුලාසි ප්‍රකාරව අත්පිට මුදල් ගෙවා භාණ්ඩ ලබාගැනීමේ හැකියාව නොමැති බැවින් රාජ්‍ය ආයතන සඳහා දින 60ක කාලයක් සඳහා ණය පදනම මත භාණ්ඩ ලබා දීම මෙම ආයතනය විසින් සිදු කරනු ලබයි. වර්තමානයේදී එම දින 60ක කාලයක දින 90 හෝ ඊට වඩා වැඩිවන අවස්ථා තිබෙන අතර ආයතනයේ ණයගැති එකතු කිරීමේ කාලය (Debtor Collection Period) සැලකීමේදී එම මූල්‍ය ප්‍රමාදය බාධාවකින් තොරව කළමනාකරණය කරගනු ලබන බව දැක්විය හැක.

2.4. වසර 50කට වැඩි කාලයක් අඛණ්ඩව ව්‍යාපාර කටයුතුවල යෙදෙමින් විශ්වාසනීයත්වය තහවුරු කළ රාජ්‍ය ආයතනයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව වෙනත් රාජ්‍ය අංශයේ ආයතනයක් වෙත ඉදිරිපත් කරනු ලබන මිල කියුම් (ලංසුපත්) සඳහා වූ ලංසු බැඳුම්කර සහ කාර්ය සාධන බැඳුම්කර වෙනුවෙන් අතිරේක මූල්‍ය පිරිවැයක් දැරිය යුතු බැවින්, එවැනි මිල කියුම් (ලංසුපත්) සඳහා වූ ලංසු බැඳුම්කර හා කාර්ය සාධන බැඳුම්කර අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම යෝග්‍ය බවද යෝජනා කරමි.

3. යෝජනා හා නිර්දේශ

3.1. රාජ්‍ය ආයතන ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව හරහා රුපියල් මිලියන 50ක උපරිම සීමාව දක්වා දැනට පවතින ආකාරයටම එක් මිල කැඳවුමක් මඟින් භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කර ගැනීම.

3.2: එසේම, දැනට පවතින ආකාරයටම ශ්‍රී ලංකා රජයේ වාණිජ (විවිධ) නීතිගත සංස්ථාව විසින් වෙනත් රාජ්‍ය ආයතනයන් වෙත මිල කියුම (ලංසුපත්) ඉදිරිපත් කිරීමේ දී ලංසු බැඳුම්කරය ලබාදීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීම.

4. අනුමැතිය

4.1. ඒ අනුව, ඉහත 3.1 හා 3.2 කරුණු සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය අපේක්ෂා කරමි.

රනිල් වික්‍රමසිංහ
මුදල්, ආර්ථික ස්ථායීකරණ හා
ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය